# දඹදෙණිය යුගය පිළිබඳව විමර්ශනාත්මක අධ්‍යයනයක්.

ඊ. ශ්‍රීපාලි
විශේෂවේදී තෙවන වසර
ඉතිහාසය අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය

**සංක්ෂේපය**

ශ්‍රී ලංකා ඉතිහාසයේ දඹදෙණි යුගය තුන්වන රාජධානිය ලෙස හඳුන්වයි. (1215-1270) රජරට ශිෂ්ටාචාරය පරිහානියට ලක් වූ මාඝ ආක්‍රමණය නිසා ලාංකිය රාජකීය කුමාරවරු තම ආරක්ෂාව පතා නිරිතදිග ප්‍රදේශයට සංක්‍රමණය විය. මෙහි ආරම්භක පාලකයා තුන්වන විජයබාහු වූ අතර ශ්‍රේෂ්ඨතම පාලකයා වූයේ දෙවන පරාක්‍රමබාහුය.

මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ ලංකා ඉතිහාසය තුළ අනුරාධපුර හා පොළොන්නරු රාජධානිවලට ප්‍රමුඛ ස්ථානයක් සෑම මූලාශ්‍රයකම හිමිව තිබුණද දඹදෙණි යුගයේ වැදගත්කම තරමක් දුරට ගිලිහීයාමට හේතුව කුමක්දැයි සොයා බැලීමයි. මෙහිදී පර්යේෂණ ක්‍රමවේදය ලෙස සාහිත්‍ය හා පුරාවිද්‍යා මූලාශ්‍රයන් භාවිතා කරන ලදී.

මෙම අධ්‍යයනයේ දී දඹදෙණි රාජධානි සමය තුළ සිදු වූ දේශපාලන පරිවර්තන, විදේශ රාජ්‍ය සමඟ පැවත්වූ සබඳතා, ආගමික තත්වය හා සාහිත්‍යය සේවය පිළිබඳ තොරතුරු අධ්‍යයනය කරන ලදී. ඒ අනුව ලංකා ඉතිහාසයේ වැදගත් ස්ථානයක් අනුරාධපුර හා පොළොන්නරු යුගවලට හිමිවනවා සේම එවැනිම වැදගත් ස්ථානයක් දඹදෙණි යුගයට හිමිවන බව පැහැදිලි විය.

**ප්‍රමුඛ පද :- දේශපාලන තත්ත්වය , දඹදෙණි යුගය**